ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2021

-------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 01 ප්‍රකාරව වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල නොදැක්විය යුතු වුවද, මුදල් ශේෂයෙන් රු. 67,021,766ක බැංකු අයිරාව හිලව් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් බැංකු අයිරාවක් ලබා ගෙන නොතිබූ අතර එහි ප්‍රධාන ගිණුම පිළිබඳ විස්තර හා අරමුදල් කළමනාකරණ ගිණුම අතර ඇති සම්බන්ධතාවය ගිණුම් සටහන් 02.11 හි දක්වා ඇත. ඒ අනුව කාර්යාංශය චෙක්පත් නිකුත් කිරීමේදී බැංකුව එයට අදාළ අවම මුදල අරමුදල් කළමනාකරණ ගිණුමෙන් ප්‍රධන ගිණුමට ස්වයංක්‍රීයව හුවමාරු කරනු ලැබේ. මෙහි ප්‍රධාන අරමුණ වූයේ ප්‍රධාන ජංගම ගිණුමේ ඇති නිෂ්කාෂණය නොවූ මුදල් මෙම බද්ද ගිණුමට දිනපතා ස්වයංක්‍රීයව ආයෝජනය කර පොළී ආදායමක් උපයා ගැනීමයි. 2021 වසර තුළදී මෙලෙස උපයාගත් පොළී ආදායම රු. 6,081,183 ක් බව සඳහන් කිරීමට කැමැත්තෙමි. එම නිසා කාර්යාංශය බැංකු අයිරාවක් ලබා ගෙන නොමැති බවත් එම ගිණුම් දෙකම එකිනෙකට සම්බන්ධ බවත් දැක්වීමට කැමැත්තෙමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු බව. |

**1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ)විදේශයන්හි ප්‍රවර්ධන කටයුතු සඳහා දූත මණ්ඩල වෙත ලබාදුන් අත්තිකාරම් | 44,058,829 | 7,459,607 | 36,599,222 | විදේශ කටයුතු අමාත්‍යාංශය ලබා දී ඇති උපදෙස් පරිදි මෙම විදේශ ව්‍යවහාර මුදල් අත්තිකාරම් සඳහා ආයතනය සෘජුව මැදිහත් නොවී විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා එම රටවල ශේෂ හා ගනුදෙනු සනාථ කිරීම් ලබා ගැනීමේ ක්‍රියාවලිය දැනටමත් සිදුවෙමින් පවතී. | දූත මණ්ඩල මගින් ගිණුම් වර්ෂය අවසාන දිනට වූ ශේෂය සනාථ කරගත යුතු බව. |
| (ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු මුදල් | 80,305,873 | 124,913,509 | 44,607,636 | මෙම වෙනසට ප්‍රධාන හේතු වනුයේ ගොඩනැගිලි කුලිය හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් නිකුත් කළ චෙක්පත්වල වටිනාකම වන රු. 6,054,536.60 ක මුදල ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබීමයි. | ආයතන අතර ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම් සැසඳිය යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට නිරවුල් නොකර පැවතුණු වර්ෂ 1ක සිට වර්ෂ 7ක් දක්වා කාලපරාසයක් තුල හිඟ හිටි උපචිත වියදම් එකතුව රු3.,778,427ක් වුවද එම ශේෂ වලින් තවදුරටත් වගකීමක් නොමැති ශේෂයන් පිළිබඳ සොයාබලා නැවත ආදායමට ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට රු. 2,346,114.28 දක්වා අඩුවී ඇති අතර ඉතිරි ශේෂයද නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටින බව දැන්වීමට කැමැත්තෙමි. | උපචිත වියදම් ප්‍රමාදයකින් තොරව පියවීමට සහ තවදුරටත් වගකීමක් නොමැති ශේෂ ආදායමට ලියාහැරීමටත් කටයුතු කළ යුතුය. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)චීනයේ ප්‍රචාරණ වැඩසටහනක් වෙනුවෙන් එරට ආයතනයක් සමග එළඹි ගිවිසුමට අනුව 2019 පෙබරවාරි 28 දින රු.25,006,463 (ඇ.ඩො.137,600) ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් වැඩසටහන අතරමග නවතා දමා තිබුණි. තවද, මැද පෙරදිග පැවැත් වීමට සැලසුම් කර තිබුණු “Riyadh Travel Fair 2020” නමැති ප්‍රචාරණ වැඩසටහන වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට 2019 දී රු.8,120,991 ක මුදලක් ගෙවා තිබුණු අතර කොරෝනා තත්ත්වය මත එම වැඩසටහන කල් දමා තිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් මෙම වැඩසටහන් නැවත ආරම්භ කිරීමට හෝ | චීනයේ ප්‍රචාරණ වැඩසටහන පාස්කු ප්‍රහාරය සමග අතරමග ඇනහිට ඇති අතර ඒ වන විට නිම කෙරුණු වැඩ ප්‍රමාණය ගණනය කිරීම අභ්‍යන්තර කමිටුවක් මගින් සිදු වෙමින් පවතී. Riyad Travel fair 2020 ට අදාල ඉඩකඩ වෙන්කර ගැනීමට ගෙවූ මුදල් නැවත කාර්යාංශය වෙත ප්‍රතිපූර්ණය කිරීම හෝ ඉදිරියේදී පැවතීමට නියමිත ප්‍රවර්ධන වැඩසටහන් සඳහා යොදා ගැනීමට එකග වී ඇත.මෙහි අවසන් තීරණයක් ගැනීම සඳහා ඉදිරි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | වැඩ සටහන් නොපැවැත් වේ නම් ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට පියවර ගතයුතු බව. |

| | | |
|---|---|---|
| අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | | |
| (ආ)විදේශ ප්‍රවර්ධන මෙහෙයුම් සඳහා 2017 වසරේ සිට 2019 වසර දක්වා දූත මණ්ඩල වෙත ප්‍රේෂණය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් අත්තිකාරම් රු . 2,030,236ක් සඳහා වර්ෂය අවසාන දින වනවිටත් බිල්පත් ඉදිරිපත් කර නොතිබුණු බැවින් එකී අත්තිකාරම් පියවීමට නොහැකි වී තිබුණු අතර ඒවායේ ප්‍රමාද කාලය මාස 29 සිට මාස 49 ක් දක්වා පරාසයක විය. | මෙම අත්තිකරම් පියවීම සඳහා ආයතනයට සෘජුව මැදිහත් වීමක් නොකළ හැකි බැවින් ලැබිය යුතු අත්තිකාරම් හා මුදල් පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා දැනමටත් කටයුතු සිදු වෙමින් පවතී. | කාල ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) 2010 ලබාදී තිබුණු රු 1,575,000.ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව විගණන හා කළමණාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසු දේශිය අත්තිකාරම් පිළිබඳ සොයා බැලීමට කමිටුවක් පත් කිරීමට නියම කළ අතර ඒ අනුව මේ පිළිබඳ කටයුතු දැනට සිදු වෙමින් පවතී. | කාල ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උපවගන්තිය | වගන්තිය ප්‍රකාරව සෑම ලිත් වර්ෂයක් අවසාන වී මාස තුනක් ඉකුත්වීමට පෙරාතුව එම වර්ෂය තුළ කාර්යංශයේ කටයුතු පිළිබඳව ඉදිරිපත් කළ යුතු වාර්තා , ප්‍රකාශනයන් හා සැළසුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත පරිදි අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | වාර්තා, ප්‍රකාශනයන් හි සැලසුම් අමාත්‍යවරයා වෙත නිසි කළට ඉදිරිපත් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 102 හා 104 රෙගුලාසි | වටිනාකම රු 308,700.ක් වන ලැප්ටොප් පරිගණක තුනක් 2013 දී අස්ථානගත වී තිබුණ ද, ඒ සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම සිද්ධිය පිළිබඳව නැවත සොයා බලා ඉදිරියේදී වාර්තා කිරීමට හා දක්වා ඇති පරිදි මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අපේක්ෂා කරන බව කරුණාවෙන් දන්වා සිටිමි. | අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව. |
| (ඇ) 2006පෙබරවාරි 21 දිනැති අංක CSA/2/3/4දරන ජනාධිපති චක්‍රලේඛය | (i)අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම්වරයා එකවර විදේශ ගමන්හි නොයෙදිය යුතු බවට දන්වා තිබුණද, 2021 ඔක්තෝබර් 05 සිට 08 දක්වා ප්‍රංශයේ පැවැත්වූ ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා එම දෙදෙනාම එකවර සහභාගී වී තිබුණු අතර ඒ සඳහා යම් විශේෂ හේතුවක් වූයේද යන්න හෙළිදරව් නොවුණි. ගමන සඳහා නවාතැන් ,සංයුක්ත දීමනා සහ ගුවන් ප්‍රවේශ පත්‍ර ඇතුලු වියදම් සඳහා ඔවුන් දෙදෙනාට රු 2,535,970.ක වියදමක් කාර්යාංශයේ මුදලින් ගෙවා තිබුණි. | අදාළ ගෙවීම සංචාරක අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශ මත ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගෙන ජනාධිපති ලේකම්වරයාගේ අනුමැතිය මත ගෙවීම් කරන ලද බව දැන්වීමට කැමැත්තෙමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු බව. |
| | (ii) විදේශ ගමන් සඳහා සහභාගීත්වය අවම විය යුතු බවට දැනුම් දී තිබියදී , ප්‍රංශය, රුසියාව සහ යුක්රේනයේපැවැත්වූ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදේශක කමිටුවේ සම්බන්ධීකාරක | ජනාධිපති ලේකම්වරයාගේ 2021.10.01 දිනැති ලිපිය මගින් ලබා දුන් අනුමැතිය මත ගෙවීම් කරන ලද බව දැන්වීමට කැමැත්තෙමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු බව. |

| | | |
|---|---|---|
| වරයා, අමාත්‍යවරයාගේ මාධ්‍ය ඒකක ප්‍රධානී, සිවිල් ගුවන් සේවා අධිකාරියේ නියෝජ්‍ය සභාපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ද සහභාගී වී තිබුණු අතර ඔවුන් සඳහා නවාතැන් ,සංයුක්ත දීමනා සහ ගුවන් ප්‍රවේශ පත්‍ර වෙනුවෙන් රු.7,135,173ක් ගෙවා තිබුණි. | | |
| (iii) ගමනට ගතවන කාලය ද ඇතුලත්ව සහභාගි වන කාලය අත්‍යවශයෙන්ම අවම කළයුතු බව දන්වා තිබියදී 2021 සැප්තැම්බර් 06 සිට 10 දක්වා රුසියාවේ සහ යුක්රේනයේ පැවැත්වූ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සංචාරක සංවර්ධන අධිකාරියේ උපදේශක කමිටුවේ සම්බන්ධීකාරක වරයා, අමාත්‍යවරයාගේ මාධ්‍ය ඒකක ප්‍රධානී සහ සිවිල් ගුවන් සේවා අධිකාරියේ නියෝජ්‍ය සභාපතිවරයා දින 07 කට කලින් ගමනට සහභාගි වීම නිසා ඔවුන් සඳහා නවාතැන් සහ සංයුක්ත දීමනා වෙනුවෙන් අමතරව රු.2,363,017ක් ගෙවා තිබුණි. | මෙම ප්‍රවර්ධන වැඩසටහන සඳහා සංචාරක උපදේශන කමිටුවේ සම්බන්ධිකරණ ලේකම්, සංචාරක අමාත්‍යාංශයේ ලේකම්, සම්බන්ධිකරණ ලේකම් හා සංචාරක අමාත්‍යවරයා සහභාගි විය යුතු බවට 2021.09.22 දින පැවැත්වූ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී තීරණය විය. තවද 2021.10.02 පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුද එක් වීමට තීරණය විය. ඒ අනුව සහභාගිවන්නන්ගේ ඇස්මේන්තුගත පිරිවැය රු.3,387,300 ක් එකතු කරමින් පුද්ගලයින් 5 දෙනෙකු සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. 8,860,500 කි. කෙසේ වෙතත් සැබෑ සහභාගිත්ව පිරිවැය රු. 6,554,910 කි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මුදල් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කළ යුතු වුවද, දින 147 ක ප්‍රමාදයක් සහිතව 2022 ජුලි 25 දින ගිණුම් ඉදිරිපත් කර තිබුණි. | එකඟවෙමි. | චක්‍රලේඛයට අනුගත විය යුතු බව |
| (ඉ) 2015 මාර්තු 26 දිනැති අංක 07/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ගෙවිය හැකි උත්සව අත්තිකාරම් මුදල රු.10,000 ක් වුවද, අමාත්‍යාංශ ලේකම් ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් එය රු.25,000 ක් දක්වා වැඩිකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුල දී සේවකයන් 78 දෙනෙකුට රු. 1,170,000 ක මුදලක් උත්සව අත්තිකාරම් ලෙස වැඩිපුර ගෙවා තිබුණි. | ප්‍රසාද දීමනා සඳහා ලේකම් අනුමැතිය අපේක්ෂාවෙන් ඉල්ලීම් කරන ලද අවස්ථාවේදී ලේකම් විසින් සියළු සේවකයින් සඳහා උත්සව අත්තිකාරම් ලෙස රු.25,000 ක දීමනාවක් ලබා දීම අනුමත කරන ලදී. උත්සව අත්තිකාරම් වැඩි කිරීම සඳහා නිර්දේශය හා අනුමැතිය අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දි ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

## 2.1 මූල්‍යප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.649,371,283ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු.328,088,281 ක අතිරික්තයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 321,283,002ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සංචාරක සංවර්ධන බදු ආදායම රු.192,847,570 න් වැඩිවීම සහ වෙළද වියදම් රු.108,922,280 න් අඩු වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

## 3.1 අනාර්ථික ගනුදෙනු

--------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාංශයේ වර්තමාන වෙළද සන්නාමය “So Sri Lanka” වන අතර 2018තෙක් පැවති වෙළද සන්නාමය “Wonder of Asia” විය . ඒ අනුව Wonder of Asia සන්නාමය සහිත එකක් රු 4,300. ක් බැගින් වූ කොඩි 398ක් | “Wonder of Asia” සන්නාමය සහිත කොඩි කාර්යාංශය මගින් සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් සඳහා එකී කොඩි භාවිතයට ගෙන ඇත. නමුත් කාර්යාංශයේ කළමනාකාරිත්වයේ තීරණය මත සන්නාමය “So Sri Lanka” | අවශ්‍යතාවය සැළකිල්ලට ගෙන මිලදී ගැනීම් සිදු කළ යුතුබව. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට ද ගබඩාවේ භාවිතයට ගත නොහැකිව පැවති අතර ඒවායේ වටිනාකම රු1,711,400 . ක් විය. | නමින් වෙනස් කිරීමත් සමග මෙම කොඩ් භාවිතයට ගැනීමට නොහැකි වී ඇත. | |
| (ආ) | 2015 වර්ෂයට පෙර මිලදී ගෙන තිබුණු පිරිවැය හදුනානොගත් වෙබ් කැමරා (Web Camera) 38 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටද භාවිතයට නොගෙන ගබඩාව තුල රඳවා තිබුණි. | 2010 IIFA උළෙල සඳහා ඇනවුම් කර උළෙල අවසන් වීමෙන් පසු නැවත ගබඩාව වෙත ලබා දුන් අතර මෙම කැමරා භාවිතයට ගත හැකිද නොහැකිද යන්න සොයා බැලීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය වෙත ලිඛිතව දන්වා ඇති අතර එම වාර්තාව ලැබීමෙන් පසු ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා මෙම කැමරා යෙදවිය හැකි බවත් මෙම කැමරා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් නිරීක්ෂණය කර වාර්තාවල ඇතුළත් කිරීමද කර ඇත. | ආයතනයේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන කටයුතු කලයුතු බව. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍ය උපදේශක කමිටුවක සම්බන්ධීකරණ නිලධාරියෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානී හෝ ඒ හා සමාන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙක් ලෙස සලකා එවැනි නිලධාරීන්ට හිමි ඉන්ධන දීමනාව වන මසකට ලීටර 140ක්, වාහනයක් සහ රියදුරෙක් ලබා දී වාහන කුලී, ඉන්ධන, රියදුරු වැටුප්,අතිකාල සහ සංයුක්ත දීමනා වශයෙන් එකතුව රු.2,874,290 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණු නමුත් උපදේශක කමිටුවේ ඉටුකල කාර්යයන් පිළිබඳව කිසිදු සහතිකයක් නොවුණි. | රාජකාරි පැවරීම සහ රාජකාරි ඉටුකිරීම තහවුරු කිරීම අමාත්‍යාංශය මඟින් ඉටු වූ අතර කාර්යාංශය විසින් සිදුකරනු ලැබුයේ වියදම් ප්‍රතිපූරණය පමණි. තවදුරටත්, මේ සම්බන්ධ ලිපිගොනු අමාත්‍යාංශය මඟින් පවත්වාගෙන යන බැවින් වැඩිදුර විස්තර සඳහා අමාත්‍යාංශයෙන් විමසීම මැනවි. | කාර්යාංශය විසින් වියදම් ප්‍රතිපූරණය කරන විට ඒ සඳහා ලැබෙන ප්‍රතිලාභය විශ්ලේෂණය කළයුතු බව. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 ඔක්තෝබර් 05 සිට 08 දක්වා ප්‍රංශයේ පැවති ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව 2021ඔක්තෝබර් 06දින පැවැත්විය යුතුවූ ප්‍රවර්ධන සන්ධ්‍යාව )Promotional Evening) අමාත්‍යවරයාගේ උපදෙස් මත එදින නොපවත්වා 2021 , නොවැම්බර් 09 දින නැවත පවත්වා තිබුණි .ඒ සඳහා අමාත්‍යවරයා ,සංචාරක උපදේශක කමිටුවේ සම්බන්ධීකාරක සහ ප්‍රවර්ධන කාර්යාංශයේ නිලධාරියෙක් සහභාගි වී රු2,999,699.ක අමතර වියදම් දරා තිබුණු අතර සංචාරක ප්‍රවර්ධන සන්ධ්‍යාව ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව පැවැත්වූයේ නම් එම වියදම වළක්වා ගැනීමට ඉඩ තිබුණි. | ශ්‍රී ලංකන් ගුවන් සේවය හා ප්‍රංශ ගුවන් සේවය එක්ව සීත සෘතුව හේතු කොට ගෙන සෘජු ගුවන් ගමන් මෙහෙයුම් දියත් කිරීමට සැලසුම් කර තිබුණි. මෙම මෙහෙයුමට සමගාමීව ශ්‍රී ලංකාව සංචාරකයින් අතර ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම ප්‍රවර්ධන සන්ධ්‍යා වැඩසටහන 2021.10.06 දින පැවැත්වීමට තීරණය කරනු ලැබීය. | ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව ප්‍රවර්ධන සන්ධ්‍යාව පැවැත්වූයේ නම් අමතර වියදම් වළක්වා ගැනීමට ඉඩ තිබුණු බව. |
| (ආ)2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සමඟ භාවිතා කළයුතු 2020 මාර්තු 25 දින නිකුත් කරන ලද අතිරේක 35 හි 2.14.1 වගන්තියට පටහැනිව සහ 2021 අගෝස්තු 17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත 2021 සැප්තැම්බර් 06 සිට 10 දක්වා රුසියාවේ සහ යුක්රේනයේ පැවත්වූ ප්‍රවර්ධන වැඩසටහන මෙහෙයවීම සඳහා නියෝජිත ආයතනයක් තෝරා ගෙන තිබුණු නමුත් එය ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකිරීමට හේතු වූ කරුණු නිශ්චිතව නොදක්වා | 31.03.2022 දිනැති අංක TIP/A/SLTPB/21/AQ/06 දරන ලිපිය මගින් පිලිතුරු 2022.06.16 දින ඉදිරිපත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සමඟ භාවිතා කළයුතු අතිරේකයට අනුකූල විය යුතු බව. |

වැඩසටහන් මෙහෙයවීම වෙනුවෙන් නියෝජිත ආයතනයට රු.10,956,871 ක් ගෙවා තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කාර්යංශය විසින් සමාලෝචිත වර්ෂය ආවරණය වන පරිදි උපක්‍රමික සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර 2021 සඳහාසකස් කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ද ළඟා කර ගත යුතු අරමුණු පැහැදිලිව හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් කාර්යංශයේ අරමුණු ළඟා කර ගැනීම සඳහා යොමු වී නොතිබුණි. කාර්යංශයේ සමස්ත වියදමෙන් සියයට 71 ක් අලෙවිකරණ කාර්යයන් සඳහා වැය වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අලෙවිකරණ සැලැස්මක් පිළියෙල කර ප්‍රවර්ධන කටයුතු සිදුකළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම විශාල බාධාවක්ව තිබූ අතර එය සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය හට උපාය මාර්ගික සැලැස්මක් හෝ කාර්ය සැලැස්මක් සැකසීමට බාධාවක් විය. දැනට මෙම වාතාවරණය සාමාන්‍ය අතට පත්වෙමින් තිබෙන අතර 2022- 2025 සඳහා උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක හා සංයුක්ත සැලැස්ම සකස් කර ඇත. | උපක්‍රමික සැලැස්මක් සහ ළඟා කර ගත යුතු අරමුණු පැහැදිලිව හඳුනාගත් ක්‍රියාකාරී සැලැස්මක් අත්‍යවශ්‍ය බව. |